# කොළඹ විශ්ව විද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශාස්ත්‍ර පීඨය

## ශාස්ත්‍රවේදී සිව්වන වසර පරීක්ෂණය - (පළමු සෙමෙස්තරය) -2018/2019

## PSC -4171 - ශ්‍රී ලංකාවේ රාජ්‍ය ප්‍රතිපත්ති සහ පරිපාලනය

**කාලය : පැ දෙකයි (02)**

ප්‍රශ්න **තුනකට ( 03 )** පමණක් පිළිතුරු සපයන්න.

එක් පිළිතුරකට ලැබෙන උපරිම ලකුණු ප්‍රමාණය **විස්සකි (20 ).**

---

1. "සංවර්ධනය වෙමින් පවතින රටවල්වල රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය කෙරෙහි බලපෑම් කිරීමට ධනවාදී රටවල් අධිරාජ්‍යවාදයේ නව මොඩලයක් ලෙස ගෝලීයකරණය භාවිත කරයි." මෙම ප්‍රකාශය විභාග කරන්න.

2. රටක ආර්ථික ස්ථාවරත්වය කෙරෙහි වෙළෙඳපොළ ප්‍රතිසංස්කරණවල ඇති මූලෝපායික වැදගත්කම නිදසුන් සහිතව සාකච්ඡා කරන්න.

3. i. සංවර්ධන සැලසුම්කරණය යනු කුමක්ද ?

   ii. 1956-1970 කාලය තුළ ශ්‍රී ලංකාවේ සංවර්ධන සැලසුම්කරණයේ සුවිශේෂී ලක්ෂණ පැහැදිලි කරන්න.

4. පහත සඳහන් දෑ විවේචනාත්මකව විභාග කරන්න:

   i. ශ්‍රී ලංකාවේ රාජ්‍ය පරිපාලනය කෙරෙහි 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ බලපෑම.

   ii. 1972 සමගි පෙරමුණු ආණ්ඩුව යටතේ පැවති මිශ්‍ර ආර්ථික ප්‍රතිපත්ති.

5. 1977න් පසු ශ්‍රී ලංකාවේ සංවර්ධන සැලසුම්කරණ ක්‍රියාවලිය විවේචනාත්මකව විමසන්න.

අ.පි.බ.

6. පහත සඳහන් මාතෘකා **දෙකක් (02)** පිළිබඳ සටහන් ලියන්න:

i. ශ්‍රී ලංකාවේ පෞද්ගලීකරණ ක්‍රියාවලිය සමග බැඳුනු ප්‍රතිපත්ති.

ii. 1971 හා 1987-89 කාලවල පැවති තරුණ අසහනය කෙරෙහි රාජ්‍ය ප්‍රතිපත්තිවල බලපෑම.

iii. ශ්‍රී ලංකාවේ බලය බෙදීම එරෙහිව බලය විමධ්‍යගත කිරීම පිළිබඳව පවතින විවාදය.

iv. නිදහසින් පසු ශ්‍රී ලංකාවේ රාජ්‍ය පරිපාලනය විමධ්‍යගත කිරීමේ විවිධ අදියර.

**************************